


විශ්ව සන්නිවේදනයේ මානව අවකාශය...

# සංජානනී 2012

SANJANANI 2012

**2012 දෙසැම්බර් 11, 12**

**දෙදින පුරා කැලණිය විශ්වවිද්‍යාල භූමියේ දී.**



සංවිධානය

ජනසන්නිවේදන අධ්‍යයන අංශය

ජනසන්නිවේදන ශිෂ්‍ය සංගමය

කැලණිය විශ්වවිද්‍යාලය

# මාධ්‍ය සංස්කෘතිය

කථිකාචාර්ය මනෝජ් පුෂ්පකුමාර ජිනදාස

සංස්කෘතිය යනුවෙන් සෑම ක්‍රියාකාරකමක්ම හඳුන්වනු ලැබේ. එය මානසික හෝ කායික වශයෙන්, සිතිවිල්ලක් හෝ වෙනත් චර්යාවක් හෝ ඒ දෙකම හෝ විය හැකිය. මානව සංස්කෘතිය ගොඩනැගෙන්නේ ඔවුනොවුන් අතර ඇති වන අන්තර් පුද්ගල සම්බන්ධයෙනි. මානව චර්යාව අධ්‍යයනය කිරීමෙහිලා ප්‍රාරම්භක විෂය ක්ෂේත්‍රය වන මානව විද්‍යාව තුළ මානවයාගේ ප්‍රාථමික සංස්කෘතියෙහි ලක්ෂණ අධ්‍යයනය කොට තිබේ. මෙහිලා මැලිනොව්ස්කි සහ එඩ්වඩ් බී. ටේලර් වැනි සංස්කෘතික මානව විද්‍යාඥයින් 19 වන සියවසේ මැද භාගයේ සිදු කරන ලද පර්යේෂණ ඔස්සේ පුළුල් ආකාරයෙන් අධ්‍යයනය කොට තිබේ. ඒ අනුව ටේලර් යන අය සංස්කෘතිය යන්නෙන් අදහස් කළේ,

**"මානව සමාජයේ කාලාන්තරයක් තිස්සේ ක්‍රමිකව ගොඩනැගුණු ඇදැහිලි, විශ්වාස, චාරිත්‍ර වාරිත්‍ර විධි, ආගම, භාෂාව ගෘහ නිර්මාණ ශිල්පය සිතුම් පැතුම් ආදී සමස්තයම සංස්කෘතිය වශයෙන් හඳුන්වනු ලැබේ".**

මේ අනුව මානව චර්යාව සකස් වන්නේ ඔවුනොවුන් අතර අන්තර් සම්බන්ධතාව පවත්වාගැනීම ඔස්සේ ය. හොඳ, නරක සදාචාරයන්, ධර්මතා, විශ්වාස, ශිෂ්ට අශිෂ්ට, උගත් නූගත්, ග්‍රාමීය, ශිෂ්ට යනාදි එකම චර්යාවේ උච්චාවචනයන් මානව සංස්කෘතිය තුළ ගොඩනැගුණි.

යුරෝපයේ ක්‍රි. පූ. 5 වන සියවසේ සිට ක්‍රි.ව. 15 වන සියවස දක්වා වන කාලපරිච්ඡේදය තුළ සිදු වූ පුනර්ජීවන ව්‍යාපාරයත් සමඟ විද්‍යාව කලාව, දර්ශනය, සෞන්දර්යය, ගණිතය ආදී නූතන විෂය ක්ෂේත්‍රවල මෞලිකාංග ඉස්මතු විය. ක්‍රි.ව. 15 වන සියවසෙන් පසු ව ක්‍රමයෙන් නූතන සමාජයට අවශ්‍ය ශක්තිමත් පදනම 16, 17, 18 යන සියවස්වල විසූ ජෝන් ලොක්, ජෙරමි බෙන්තම්, ජෝන් ස්ටුවර්ට් මිල් යන දාර්ශනිකයන් විසින් සපයා ඇත. මේ ඔස්සේ නූතන ආචාර ධර්ම ක්‍රියාවලියේ පදනම පුළුල් සමාජ කථිකාවක් ඔස්සේ ස්ථාපිත විය.

ක්‍රමයෙන් 16 සහ 17 වන සියවස්වල යුරෝපයේ භෞතික විද්‍යාත්මකව හා රසායන විද්‍යාත්මකව සිදු වූ අත්හදා බැලීම් තවදුරටත් උන්නතිකවීම ඔස්සේ වර්ධනය වූයේ ඒ වන විට යුරෝපීය ජන සමාජයේ ප්‍රබලව ඉස්මතු වූ රටවල් කිහිපයක් තුළ ය. ඒවායෙහි ආර්ථික සමාජ සංවර්ධනය පමණක් නොව සමකාලීන ආගම, දර්ශනය, මතවාද ලෝකය අතර ව්‍යාප්ත කිරීමෙහිලා අවශ්‍ය වූ සමාජ, ආගමික, දේශපාලන උපකරණය වන ජනමාධ්‍ය බිහිකර ගැනීමට අවශ්‍ය පදනම මෙයින් ඉස්මතු විය. මේ ඔස්සේ ක්‍රමයෙන් 18 වන සියවස වන විට යුරෝපයේ කාර්මික විප්ලවය සිදුවීමේ අතුරු ප්‍රතිඵලයක් ලෙස ජන මාධ්‍ය විශේෂයෙන් මුද්‍රිත මාධ්‍ය හා චිත්‍රපට මාධ්‍ය 18 වන සියවසේ දී තවදුරටත් යුරෝපය පුරා සංසරණය විය.

1455 දී පමණ ජොහැන්නර්ස් ගුටෙන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමත් සමඟම එකවර පිටපත් ගණනාවක් මුද්‍රණය කිරීමට ඇති අවස්ථාව මානව සංස්කෘතිය තුළ සුවිශේෂ ස්ථානයක් ගන්නා ලදී. ක්‍රමයෙන් මෙම සංසිද්ධිය යුරෝපයේ ක්‍රිස්තියානි ආගම ආසියාතු, අප්‍රිකාතු, නැගෙනහිර, ආසියා කලාප වල ව්‍යාප්ත කිරීමට උපකරණය බවට පත් විය. 18 වන සියවසේ කාර්මික විප්ලවයෙන් පසු විසිවන සියවසයේ මුල භාගය තුළ ගුවන් විදුලි මාධ්‍ය (1920), රූපවාහිනී මාධ්‍යක් (1930) බිහිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස ජනමාධ්‍ය තවදුරටත් මාධ්‍යමය ස්වභාවය අතින් පුළුල් වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1950 දශකය වන විට ඇමරිකානු ජන සමාජය දිනකට රූපවාහිනිය නරඹන ප්‍රමාණය දිනකට පැය 7 ක් දක්වා වැඩි විය. රූපවාහිනියේ ආක්‍රමණයත් සමඟ පුවත්පතට හිමි වූ වැදගත්කම හා ජනප්‍රියත්වය ක්‍රමයෙන් පහත වැටීම ය. පුවත්පත් ප්‍රමාණය මෙන්ම පුවත්පත් මාධ්‍යයේ ගුණාත්මක අගය ද ක්‍රමයෙන් පහත වැටිණි. මේත් සමඟම ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍යයට ඇති සමාජ අවධානය හා රුචිකත්වය ක්‍රමයෙන් වර්ධනය විය. 50 දශකය අග භාගය වන විට පරිගණක තාක්ෂණය විසිර වීමෙන් 21 වන සියවෙස් මැද භාගයේ දී නව මාධ්‍ය සමාජයක් ස්ථාපනය වීමට අවශ්‍ය ශක්තිමත් සමාජ පදනම සකස් විය.

මේත් සමඟ යුරෝපයේ කේබල් රූපවාහිනිය, ජාල රූපවාහිනිය තවදුරටත් තාක්ෂණික වශයෙන් වර්ධනය වීම අන්තර්ජාල සජීවී මාධ්‍යය භාවිතය 80 දශකය වන විට මාධ්‍යයේ ප්‍රධාන මෙවලම බවට පත් විය. 20 වන සියවසේ අගභාගයේ දී ඉස්මතු වූ අන්තර්ජාල මාධ්‍යයත් සමඟ 21 වන සියවස මුල වන විට ජංගම දුරකථනය නැමැති නව මාධ්‍ය ඒකකය සොයා ගැනීම හේතු කොට ගෙන මානව සංස්කෘතියේ පැතිකඩ සම්පූර්ණයෙන් වෙනස් වන්නට විය.

20 වන සියවසේ මුල සිට 21 වන සියවසේ මුල් දශකය වන විට නව මාධ්‍ය සමාජය සමඟ මානවයාගේ පුද්ගල අන්තර් සමාජ සම්බන්ධතාවන් සීඝ්‍රයෙන් පරිණාමයට පත් විය. 1950 දශකයේ අවසාන දශකයත් සමඟ යුරෝපයේ ක්‍රමයෙන් ඉස්මතු වූ නව ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රය වූයේ සංස්කෘතික අධ්‍යයනය යි. ඒ තුළ බෙහෙවින් අවධාරණය වූයේ කලාව, සාහිත්‍ය, රංග කලාව හා නාට්‍ය සහිත ගෘහ නිර්මාණ ශිල්පය, සෞන්දර්ය වැනි විෂය ක්ෂේත්‍රවල රසය සමඟ අධ්‍යාත්මික පක්ෂය විවරණය කරනවාට වඩා 20 වන සියවසේ මැද භාගය වන විට මුහුණ දුන් නූතනත්වය තුළ මේවා පුළුල්ව විග්‍රහ කර ගැනීමයි. මෙම ශාස්ත්‍රීය ගවේෂණයේ ප්‍රතිඵල ලෙස ප්‍රංශ සහ ජර්මන් දර්ශනය අති ව්‍යාප්ත වීමෙන් පශ්චාත් නූතන වාදය එක් අතකින් දාර්ශනික විෂය ක්ෂේත්‍රයක් ද සාහිත්‍ය ධාරාවක් ද මතවාදමය චින්තනයක් ද විකල්ප ධාරාවක් ද වන අතර තවත් අතකින් දේශපාලනය ආර්ථික සමාජ වෙනස්වීමක් ද වන මෙම නව සමාජ කතිකාව මේතාක් නොවූ විරූ මගකට සංස්කෘතියේ නව අංග ලක්ෂණ නවමු ආකාරයෙන් ඉදිරිපත් වන්නට විය. ඒවා පෙර වූ විශ්ලේෂණයන්ගෙන් වෙනස් වූයේ මානව ලිංගිකත්වය, සමාජය, පවුල අන්තර් සම්බන්ධතාව, කලාව, යථාර්ථය, දේශපාලනය, අර්ථ ක්‍රමය යනාදිය හුදු කේවල ප්‍රපංචයක් නොවී ඒ සියල්ල මානවයාගේ සිතිවිලි හා චර්යාවන් තුළින් පතිතවන නිෂ්පාදනය පමණක් නොවී පෙරලා නව තාක්ෂණික මෙවලම් ඔස්සේ ප්‍රතිනිරූපණය වන නව මාධ්‍ය චර්යාවක් බවට ක්‍රමයෙන් පත් වෙමිනි. නව තාක්ෂණික උපකරණ මානවයාගේ ජීව අජීව සෑම අවශ්‍යතාවකටම හේතු විය.මෙම නව මාධ්‍ය

භාවිතය මානව පුද්ගල අන්තර් සම්බන්ධතා වලින් ගොඩනැගුනු සුපිරි සදාචාරාත්මක සංස්කෘතිය දෙදරා යන්නට විය. සම්ප්‍රදායික මානව සංස්කෘතියේ පැවති සම්භාව්‍ය ලක්‍ෂණ ක්‍රමයෙන් දියවී යන්නට විය.

මානව ජන සමාජයේ සියලුම සංස්කෘතික ගොඩනැගීම් නව තාක්‍ෂණික උපකරණ තුළින් ප්‍රති නිරූපණය වන්නට වීමත් සමඟම මානවයාගේ නෛසර්ගික සංස්කෘතික චර්යාවන් (ලිංගිකත්වය, ප්‍රජනනය, ආදාරය, විවාහය) පෙරලා ජන මාධ්‍ය තුළින් නිරූපණය වන්නට පටන් ගත්තේ ය. අනෙක් අතට මානවයාගේ චර්යාවන් ජන මාධ්‍ය මගින් මවන නව ජීවන රටාවන්ට අනු ගතව ක්‍රමයෙන් සකස් විය. ඒ අනුව ජනමාධ්‍ය මගින් මවන භාෂාව, මානව භාෂාව බවට ක්‍රමයෙන් පත්විය. ජන මාධ්‍යය මගින් මවන දේශපාලනය ප්‍රායෝගික දේශපාලනයට බවට පත් විය. එම නිසාම 19 වන සියවස වන විට ඇමරිකානු දේශපාලනඥයෙක් වන තෝමස් ජෙෆර්සන් පැවසුයේ ජනමාධ්‍යයෙන් තොර දේශපාලනයත් දේශපාලනයෙන් තොර ජනමාධ්‍යයත් පැවැත්ම උගහට වන බවයි.

ජනමාධ්‍යයෙන් මවන රසිකත්වය මේ තත්කල් මානව සමාජයේ තිබූ ආචාර විද්‍යාව පරයා යමින් නව මාධ්‍ය සමාජයේ ගාම්භිර කලාව බවට පත් විය. මුල් මානව සංස්කෘතියේ පවතින බොහොමයක් චර්යා රටාවන් සහ නව නිෂ්පාදනයන්ගේ ස්වරූපය ක්‍රමයෙන් අවුල් වියවුල් බවට පත් වෙමින් නව ජීවන ශෛලීන් සහ විලාසයන් 20 වන සියවසේ අවසාන භාගය තුළ ට එක්කාසු විය. එහි ප්‍රතිඵලයක් ලෙස 19 වන සියවසේ හෝ 18 වන සියවසේ ප්‍රතිශ්ඨාපනය වූ බොහෝමයක් සමාජමය දේශපාලන ආර්ථික සංකල්ප (උදා : ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම්, සමාජවාදී රාජ්‍ය, සම්භාව්‍ය කලාව, සදාචාරය, නිතී රීති, හොඳ නරක, ශිෂ්ට අශිෂ්ට, ගැමි, නාගරික යනාදි සංකල්ප 20 වන සියවසේ අගභාගයෙන් පසු තේරුම් බේරුම් කරගැනීම මහා පටලැවිල්ලක් බවට පත් විය. ඒ අනුව බොහොමයක් රාජ්‍ය සහ මානව සමාජ මෙම ජනමාධ්‍ය මූලික මානව සමාජයේ නැඟෙන සමාජ, ආර්ථික, දේශපාලනික ගැටලු වලින් හෙම්බත් වන්නට විය. බොහෝ ශාස්ත්‍රිය කථිකාවන් මෙන්ම විද්‍යාත්මක පර්යේෂණවල ප්‍රතිඵල ද ප්‍රායෝගික වැදගත් කමක් නොමැති තත්ත්වයකට පත් විය. රටවල දේශපාලන ක්‍රමයේ සිට ආර්ථික ක්‍රමය මෙන්ම විවිධ ආයතනවල අධ්‍යාපනය, සෞඛ්‍ය, සංවර්ධනය වැනි ක්ෂේත්‍ර පවා මෙම නව මාධ්‍ය තුළින් ගොඩනැගෙන සංස්කෘතික සමාජ වල පැරණි අර්ථකථන ඉස්මතු කිරීමට යෑමේ ප්‍රතිඵලයක් ලෙසට ම ජනසමාජ අතරමං විය. ඒ අනුව 20 වන සියවසේ මුල භාගයේදී නව මානව සමාජයේ සංස්කෘතිය යථාවබෝධය සඳහා ජනමාධ්‍යයේ ව්‍යුහාත්මක ලක්‍ෂණ මෙන්ම එහි ක්‍රියාකාරිත්වය අන්තර්ගතය සහ මාධ්‍යන්ගෙන් සිදුවන සමාජ බලපෑම බහු විෂයික මානයකින් අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව ඉස්මතු විය. මෙහි ප්‍රතිඵලය වූයේ මාධ්‍ය මූලික නව සංස්කෘතික රටාවන් බිහිව ඇති ආකාරයත්, ඒවා තේරුම් ගැනීමට බහු විෂයීක න්‍යායක් අවශ්‍යවීමත් යන ප්‍රතිවේදයන්ට (අභ්‍යන්තර ඥානයන්) නූතන මිනිසා ක්‍රමයෙන් හැඩ ගැසීමයි. එහෙත් මාධ්‍ය මූලික සංස්කෘතියක ජීවත්වන 2 සියවසේ මුල භාගය පසු කරමින් නූතන මිනිසාට ජනමාධ්‍ය සමඟ ඔහු / ඇය පවත්වන අන්තර් සම්බන්ධතාව පෙර මානවයා සමඟ පැවැත්වූ අන්තර් සම්බන්ධතාවට වඩා අත්‍යන්තයෙන්ම වෙනස් වූවක් බව නොතේරීමයි. එමනිසා මානවයා ජනමාධ්‍ය සමඟ ඇසුරු කරන්නේ තවත් ස්ත්‍රියක හෝ පිරිමියක

සමඟ ඇඟැලුම් පාන විලසිනි. මෙහි ප්‍රතිඵලය වන්නේ පුද්ගලයා වෙනස් වීම මිස ප්‍රතිඵලය වෙනස් නොවීමයි. ප්‍රතිඵලය වෙනස් වන්නේ මීට සියවසකට කලින් සංසන්දනය කරන විට විනා මාධ්‍ය සමාජය තුළ උද්ගත වූ සංස්කෘතික රටාවන් සමඟ සංසන්දනය කිරීමෙන් නොවේ. මාධ්‍ය සංස්කෘතිය තේරුම් ගැනීමට යාම පවා බිහිසුණු සුළි සුළං මැද සැරිසරන මහ මුහුදෙහි අතරමං වූ රුවල් නෞකාවකට මුහුණ දීමට සිදුවන අභියෝගයකට සමාන අභියෝගයකට මුහුණ දීමට සිදු වීමකි.